සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

# පිළිතුරු පත්‍රය
# Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

| | | | |
|---|---|---|---|
| (1) 3 | (11) 1 | (21) 4 | (31) 2 |
| (2) 2 | (12) 2 | (22) 4 | (32) 1 |
| (3) 4 | (13) 3 | (23) 1 | (33) 1 |
| (4) 1 | (14) 3 | (24) 2 | (34) 3 |
| (5) 4 | (15) 4 | (25) 4 | (35) 2 |
| (6) 2 | (16) 1 | (26) 2 | (36) 4 |
| (7) 4 | (17) 2 | (27) 3 | (37) 1 |
| (8) 3 | (18) 4 | (28) 4 | (38) 2 |
| (9) 2 | (19) 1 | (29) 3 | (39) 4 |
| (10) 4 | (20) 4 | (30) 2 | (40) 2 |

(ලකුණු = 40)

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

(01) (i) අ) ප්‍ර , ප්‍රෟ
ආ) ව, ෆ

(ii) අ) උදලු + අ - උදැල්ල ආ) බල + ඊම් - බැලීම්

(iii) දමා, පිළිස්සී, දිනය, ධාතු වැනි අර්ථ මතු වන සේ උක්ත ආඛ්‍යාත නිවැරදි ව ගැළපූ වාක්‍ය සඳහා ලකුණු දෙන්න.

(iv) (අ) ප්‍රබලතා, දුබලතා, කුසලතා, වැනි පද පිළිගන්න.
ආ) ලිය + ඉලි - ලියවිලි ලිය + මන් - ලියමන්

(v) අ) අර්චනීය - පිදිය යුතු ආ) අතික්‍රමණය - ඉක්මවා යාම

(vi) අ) නියර/ මියර මිටි තැනින් ලු වතුර බහින්නේ වැනි ගැළපෙන පිරුළු පිළිගන්න.
ආ) හැට පැන්නත් වඳුරා බිම නොයයි
ආරේ ගුණ නැරේ
උණ පුරුකේ දැම්මත් බලු වලිගේ ඇද අරින්න බැහැ. වැනි පිරුළු පිළිගන්න.

(vii) අ) කුස ගිනි ආ) නාග මාණවිකාව / නා මෙණෙවිය

(viii) (අ) ගොවීන් නිපදවන දෙයින් අතරමැදියෝ ලාභ ලබති.
ආ) නංගීත්, නුඹත්, මමත් උදාර එනතුරු බලා හිඳිමු.

(ix) අ) තැගි + අ - තැග්ග - ද්විත්ව රූප සන්ධි
ආ) ගුණ සාගරය - උපමා අපර පද විශේෂණ සමාස (විශේෂණ සමාස වුව ද සෑහේ)

(x) අ) ඔහු/ ඇය/ ඔව්හු යන පදවලින් එකක් ගෙන ඉන් උක්ත ආඛ්‍යාත නිවැරදි වාක්‍යයක් ලියා ඇත්නම් ලකුණු දෙන්න ආ) දූරියක (2×10= 20)

(02) ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25

- සාරවත් භාවය ලකුණු 07
  අදාළ මාතෘකාව ලකුණු 01
  08

- තේමාවට අදාළ බව ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරු බව, හා සමාන බව, වචන ගණන 250ට සමීපව පැවතීම යන කරුණු සාරවත් භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.
- සංවිධානය , නිර්මාණාත්මක බව, හා ස්වීයත්වය (ලකුණු 12යි.
  මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය , සංවිධානය නිර්මාණශීලි ප්‍රකාශන ස්වීයත්වය , ව්‍යක්ත ලේඛන වහර ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.
- ශිල්පීය දක්ෂතා (ලකුණු 05යි
  ව්‍යාකරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

(ලකුණු විග්‍රහය - 08+12+05 = 25)

මුඛ්‍ය කරුණු :-

(අ) ● ස්වභාවික පරිසරයේ ක්‍රියාකාරකම් පවිත්‍ර ය සුන්දර ය.
- ඒ සඳහා මිනිස් මැදිහත් වීමෙන් සිදුවන ක්‍රියාකාරකම් අනවශ්‍ය වේ.
- පරිසර රටා සුන්දර ව අඛණ්ඩ ව ගලා යාමට නම් මිනිස් හැඟුමත් සංවේදී විය යුතු ය.
- අතීත මිනිසා මෙන් සංවේදී වෙමු. පරිසරයට බාධා වන සීමා මායිම් නොදමමු. මිනිස් ක්‍රියාකාරකම් පරිසර පැවැත්මට මැදිහත් නොකරමු.

(ආ) ● අතීතයේ පවුල් සංස්ථාව තුළ සවිමත් මා පියන් දරු සබඳතාවක් පැවතිණි.
- විද්‍යාවේ දියුණුවත් සමඟ ජංගම දුරකථනය බිහි විය..
- ඒ තුළට විවිධ මෘදුකාංග එකතු වීම නිසා ළමයාගේ සිට මහල්ලා දක්වා ඊට ආසක්ත වී ඇත.
- එකිනෙකා හා සුහද කතා බහ අඩු වී ඇත.
- නොහඳුනන්නන් සේ කුටුම්භය තුළ දිවි ගෙවති.
- අතීතයේ මෙන් මානව සබඳතා ගොඩ නගන සමාජයකට ඉඩ හසර සලසමු.

(ඉ) ● සමාජ ජීවියෙකු වන මිනිසාට සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ.
- සන්නිවේදනයේ මාධ්‍ය වන කතාබහ සංවාද ආදියේ දී අවධානය හා ආචාරශීලිත්වය වැදගත් ය.
- කතාබහේදී විවිධ තරාතිරම් , වයස් මට්ටම් , පූජනීයත්වය, ආදිය සලකා බැලිය යුතු ය.
- ප්‍රියමනාප කතා බහ සංවාද තුළින් යහපත් පරිසරයක් සැකසෙනවා මෙන් ම තමාගේ ප්‍රතිරූපය ද විශාල හා යහපත් වේ.
- එවිට එකිනෙකාට ගරු කරන යහපත් සමාජයක් බිහිවේ.
- යහපත් සමාජයක් ගොඩ නැගීමට දායක වෙමු.

(ඊ) ● අපට වර්තමානයේ පහසුවෙන් ජීවිතය ගත කළ හැකි භාණ්ඩ හා සේවා බොහෝ ය.
- එම භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට බොහෝ දෙනා හොඳින් හෝ නරකින් මුදල් උපයන්නෝය.
- එම මුදල් භාවිතයෙන් ජීවිතය පහසුවෙන් ගත කරති.
- වැඩි විවේකය වේදනා සපයයි. කාලය නිකරුණේ ගත වෙයි.
- මෙනිසාම විශාල පෞද්ගලික රෝහල්, කාය ප්‍රවර්ධන මධ්‍යස්ථාන හා රූපලාවණ්‍යාගාර බහුල ව ගොඩ නැගෙයි.
- මේවා සමස්ත දේශය ම රෝගී වීමේ ලක්ෂණයි.
- සමාජය මින් වළක්වා ගැනීමට යමක් කළ යුතු ය.

(03) සාරාංශකරණය - මුළු ලකුණු 10 යි.

| | |
|---|---|
| ලකුණු විග්‍රහය - අන්තර් ගතය ලකුණු | 06 යි |
| වචන ගණනට ලකුණු | 02 යි |
| ශිල්පීය දක්ෂතා ලකුණු | 02 යි. |
| මුළු ලකුණු | 10 යි |

Department of Education Western Province

අන්තර්ගතයට අදාළ මුඛ්‍ය අදහස්

- භාෂාව යන සන්නිවේදන මෙවලම මිනිසා අන් සතුන්ගෙන් වෙන් කෙරෙන සාධකයකි.
- භාෂාවේ ප්‍රභවය අවිනිශ්චිත වුවත් සන්නිවේදනයට පිටිවහලකි.
- මානව ශිෂ්ටාචාරයේ අතීතය අධ්‍යයනයේ දී එකිනෙකාට අදහස් හුවමාරුවේ අවශ්‍යතාව පවතින්නට ඇත.
- සරල සන්නිවේදනයක යෙදුණත් සාර්ථක නොවන්නට ඇත.
- භාෂාව එම අඩුව සපුරාලූයේ ය.
- තාක්ෂණික දියුණුවෙන් ජනමාධ්‍ය ඔස්සේ නව මං විවර වී අතීත මිනිසා භාවිත භාෂාව පුළුල් භාවිතයකට හුරු විය. (තනි ඡේදයක් සේ ලියා තිබිය යුතුය.)

(ලකුණු 10)

(04) අවබෝධය

(i) සංගීතය ඉගැන්වීමේ දී ශිෂ්‍යයාට විෂය ග්‍රහණය තහවුරු කිරීමට යොදන ක්‍රමවේද හා වෑයම (මේ හා සමාන පිළිතුරු භාර ගන්න.) (ලකුණු 02)

(ii) තුනයි . සම්ප්‍රජානන, ග්‍රහණ කැමැත්ත, වරණය අවධානය (ලකුණු 0.5 × 4 = 02)

(iii) ග්‍රහණය (ලකුණු 02)

(iv) (සංගීත) විෂය කෙරෙහි ශිෂ්‍යයා සතු කරගන්නා දැනීම (ලකුණු 02)

(v) ''නූර්ති ගීයක් ගත්විට එහි ස්ථායී අන්තරා , අතුරු වාදන සංගීත භාණ්ඩ , හා එම භාණ්ඩවලින් ගොඩනගන රිද්මය ආදී වශයෙන් වෙන් වෙන් ව අධ්‍යයනයට යොමු කරවීම. (ලකුණු 02)

(ලකුණු 02 × 05 = 10)

(05) ප්‍රායෝගික ලේඛන ලකුණු 15

වෙළඳ දැන්වීම ආකෘතිය ලකුණු 05

- මාතෘකාව ලකුණු 01
- පළකරන්නාගේ නම/ තනතුර ලකුණු 01
- පළ කරන දිනය ලකුණු 01
- නිර්මාණාත්මක බව ලකුණු 02

ලකුණු 05

<u>අන්තර්ගතය</u> ලකුණු 07

- සබන් වර්ගයේ නම ලකුණු 01
- නිෂ්පාදනයේ දී භාවිත ද්‍රව්‍ය ලකුණු 01
- භාවිතයෙන් ලැබෙන වාසි ලකුණු 01
- මිල ලකුණු 01
- ලැබෙන වට්ටම් ලකුණු 01
- ආයතනය ලකුණු 01
- දැන්වීම්කරු ලකුණු 01

<u>ශිල්පීය දක්ෂතා</u> ලකුණු 03යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය , උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය , පැහැදිලි අත් අකුරු , නිවැරදි පද බෙදීම, වියරණය විරාම ලක්ෂණ ආදිය. සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 5 + 7 + 3 = 15)

<u>ආකෘති</u> පිරවීම - මුළු ලකුණු 15 යි.

ආකෘතිය ලකුණු 05
මාතෘකාව ලකුණු 01
ඉල්ලුම්කරුගේ ප්‍රකාශය ලකුණු 02
ඉල්ලුම් කරන දිනය ලකුණු 01
ඉල්ලුම්කරුගේ අත්සන ලකුණු 01

ලකුණු 05

Department of Education – Western Province

අන්තර්ගතය ලකුණු 07

- ඉල්ලුම් කරන තනතුර (ලකුණු 01)
- ස්ත්‍රී / පුරුෂ භාවය (ලකුණු 01)
- නම හා ලිපිනය (ලකුණු 01)
- උපන්දිනය හා වයස (ලකුණු 01)
- අධ්‍යාපන සුදුසුකම් (ලකුණු 01)
- වෘත්තීය පළපුරුද්ද (ලකුණු 01)
- ඉංග්‍රීසි භාෂාවේ චතුර බව (ලකුණු 01)

(ලකුණු 07)

ශිල්පීය දක්ෂතා (ලකුණු 03)

නිවැරදි අක්ෂර වින්‍යාසය , උක්ත ආඛ්‍යාත පද සම්පිණ්ඩනය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණය, විරාම ලක්ෂණ , ආදිය සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 5 + 7 + 3 = 15)

Department of Education – Western Province

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

(01)

(i) (අ) තලතා දේවිය
(ආ) බ්‍රහ්මදත්ත රජු

(ii) (අ) ගාන්ධර්වයා
(ආ) උපමාලංකාරය

(iii) (අ) වෙද රාල/ පුංචි රාල
(ආ) බබුන්

(iv) (අ) සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙනු බව සිතනු පුතේ
(ආ) දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල

(v) (අ) සිංහබාහු විසිනි
(ආ) සුප්පා දේවිය තමා වංග දේශයෙහි රාජ කුමාරියක් යැයි පැවසීම ය.

(vi) (අ) අංගුලිමාලගේ පියා/ භර්ග බමුණා
(ආ) අංගුලිමාලයන් සෙවීමට ය.

(vii) (අ) සැළලිහිණි සංදේශය
(ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

(viii) (අ) මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා /කුණු ඉනිස්පැක්ටර්.
(ආ) වැසිකිළියක්

(ix) (අ) මහගමසේකර
(ආ) තුංමං හන්දිය / මනෝ මන්දිර

(x) (අ) එච්.එම්. කුඩලිගම
(ආ) කොළඹ යුගයේ දෙවන කවි පරපුර.

(ලකුණු 2 × 10 = 20)

(02)

(i) (අ) පිළිසිඹියා - විශ්ලේෂණය කොට දැක ගැනීමේ නුවණ.
පසඟ - අංග පහක් (නළල, දෙදණ, දෙවැලමිට)
(ආ) මහණ කරන්නට ආරාධනා කළේ ය.

(ii) (අ) උදුළ - බබලන   සුපුල් - මනා සේ පිපුණු
(ආ) නිර්මල වූ සඳ එළිය මෙන් බබලන වැලි තලාව

(iii) (අ) මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයන් කේවට්ට පඩිතුමා විසින් සැලසුම් කළ ජයපානෝත්සවය සුනු විසුනු කිරීම නිසා ය..
(ආ) දණ්ඩකින් පහර කෑ සර්පයකුගේ කෝපය ඉතා දැඩිය. රජතුමාට ඇති වූ කෝපය ද එසේ ම විය. මේ නිසා උපමාව හොඳින් ම ගැළපේ.

(iv) (අ) කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස
(ආ) උත්ප්‍රේක්ෂාලංකාරය

(v) (අ) පුංචි පැටවා - අලුතින් තැනුණු වැසිකිළිය
මහා එකා - ඔවුන්ගේ නිවස
(ආ) කථකයා අධික සතුටට පත් වී ඇත.

(ලකුණු 4 × 5 = 20)

(03)

(i) සංවාදශීලි බස් වහර

- හර්ග බමුණා සහ කොසොල් රජු අතර සංවාදය
  උදා:- ''දවස් ගිය සෙ සුව ද?'' දවස් ගිය සෙ නොසුව'' යැ
  ''කිමෙක් වෙ - ''සොරෙක් වෙ''
  ''එක සොරෙක් වෙයි මහා ''- '' එක සොරෙක් වෙයි මහ රජ''

- දිසාපාමොක් ආචාරීන් සහ අහිංසක කුමරු අතර සංවාදය
  ''පුතැ මිනිස් දහසක් මැරුව මැනවැ ''-'' ඇපි අන්නට  හිංසා නොකරන කුලයෙහි උපන්නම්හ.
- බුදුන් හා අංගුලිමාල අතර සංවාදය
  ''සිට මහණ'' ''මම සිටියෙමි තො ද සිට''
- කොසොල් රජු හා ගැමියන් අතර සංවාද
- කොසොල් රජු හා බුදුන් අතර සංවාද

(ii) කෙටි වැකි භාවිතය :-

- අහිංසක කුමරුගේ විලාසය පවසන අවස්ථාව
  ''මන වඩන නියායෙන් හැසිරෙයි'' පෙම් වඩන නියායෙන් බෙනෙයි''
  ''නුවණ නැත්තෙ යැ'යි නොකිය හැක්ක'' ................

- අංගුලිමාල මිනිසුන්ගේ ඇඟිලි කපන අවස්ථා
  ''එකෙකි ඇඟිලි කපාගෙන තබයි. තුබු  තුබු තැන නස්සී........
  ''අධන්මග පිළිපන්හු. එකල්හි ගොන් රක්නාහු , වස්සන් රක්නාහු''
  මේ ආදී උදාහරණ  සමඟ පිළිතුරු සනාථ විය යුතු ය.

| | |
|---|---|
| උදාහරණ 04 සඳහා | ලකුණු 04 |
| සමස්ත විස්තරයට | ලකුණු 11 |
| මුළු ලකුණු | ලකුණු 15 |

Department of Education - Western Province

නැතහොත්

**(i)** සිහින ලොවක ජීවත් වී

උදා:-
- පෙරදිග මහාර්ඝ තිරරෙදිවලින් අලංකාර කරන ලද උස් ලෝකඩ පහන් රුක්වලින් ඒකාලෝක කරන ලද ගිනි උදුනේ සුව පහස් දනවන ලද .........
- ඇයට ඇඳුම් පැලඳුම් හෝ මුතු මැණික් හෝ කිසිවක් නොතිබුණේ ය. එහෙත් ඇය ආශා කළේ ඒවාට මය.

**(ii)** සැබෑ ලොවට පියමං කරන අයුරු:-

ලොයිසල් මහත්මිය (මැටිල්ඩා) ඇයගේ යෙහෙළියගෙන් ඉල්ලාගත් මාලය නැති වූ අතර එය සැබෑ ම දියමන්ති මාලයක් යැයි සිතා එය නැවත ලබා දීම සඳහා මුදල් සොයා ගැනීමට කරන ලද කැප කිරීම්, කටුක අත්දැකීම් විස්තර විය යුතු ය.

| | |
|---|---|
| උදාහරණ 04 සඳහා | ලකුණු 04 |
| සමස්ත විස්තරයට | ලකුණු 11 |
| මුළු ලකුණු | ලකුණු 15 |

(04) **(i)** මිනිස් සමූහයාත් -

උදා "නිති නිරිඳුගෙ රැකවලෙහි නියුක්තෝ...
මනමත් කරවන දන මුළු දෙරණා ........

**(ii)** සත්ත්ව සමූහයාත් -

උදා :- පියසත් නොව බිඟු දැල් රැඳී කොපුලී.....
කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ....
නන් දන කැන් දුටුවද බිය සිස් වූ......
වර වෙණ නද අසමින් සිත සතොසිනි ..................
අසන රිසින් නයි කැල ඔසලෝයා.....

යන ආදී පද්‍ය සමග පිළිතුරු සනාථ විය යුතු ය.

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 04 |
| සමස්ත විස්තරයට | ලකුණු 11 |
| මුළු ලකුණු | ලකුණු 15 |

Department of Education - Western Province

නැතහොත්

**(i)** ජන වහර භාවිතයත් :-

උදා :- පුරපසේ සඳ එක්ක තරගයට
දිය නිලන වැසි සමේ
දෙවැට දිග කරඳ වැල්
රැගෙන දෝතට පුරා
සුවඳ බැරුවා ඉන්ට...

**(ii)** සම්භාව්‍ය භාෂාව :-

උදා :- සන්නාලියන් , කෘශව, සුදුමැලිව, නයන, සොඳුර, ගිම්හානයේ , දුෂ්කරය, මෙවැනි යෙදුම් සමඟ පිළිතුරු සනාථ විය යුතුය.

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 04 |
| සමස්ත විස්තරයට | ලකුණු 11 |
| මුළු ලකුණු | ලකුණු 15 |

(05) උචිත උපමාලංකාර යෙදීම :-

වඳුරකු මෙන්, ගසක පොත්තක් මෙන්, කෙළවලින් තෙමුණු රේඛාවක් ලෙසිනි. සිහිනයක් මෙන්, කැලය ගම මැදට කඩා පැනීමක් මෙනි. පුංචිමැණිකා මුවැත්තියක් වාගේ බියපත් සිවල් දෙනක මෙන්.

උත්ප්‍රේක්ෂාලංකාරය :-

- අලුපැහැති කොළ හා දම් පැහැති මල් ඇති වරා පඳුරු හා මානා පඳුරු ද දිග තියුණු කටු ඇති පතොක් පඳුරු ද වැට අද්දරින් රිංගා අවුත් මිදුලටත් ගෙයි බිත්තිවලටත් හා දොරකඩටත් ළං විය.

- බැද්දේගම පුරුදු නිදිබර උදාසීන ස්වභාවය ඉසිළුවා ය.
- අව්ව හා සුළඟත් වෙහෙසත් බඩගින්නත් , ලෙඩ දුකත් ශරීර ශක්තිය මෙන්ම මානසික ශක්තිය ද උරා බොයි.

යුගල පද යෙදීම :- හිර හිඳලන් බඩු මුට්ටු , ළමා ළපටි, අවතාර අඩිකෝඩ

- සජීවී සංවාද භාවිත ය.
- අවස්ථානුකූල කෙටි වැකි භාවිතය. :- ඔවුහු කෑම කති, නිදා ගනිති.

යන ආදී කරුණු 3ක් උදාහරණ මගින් විස්තර විය යුතු ය.

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 03 |
| සමස්ත විස්තරයට | ලකුණු 07 |
| මුළු ලකුණු | ලකුණු 10 |

(06) සාම්ප්‍රදායික උපමාවලින් බැහැරවන අවස්ථා :-
''කිරඹ පොකුරු මී රස ලැබ බොන ලෙසට''
සතර'ත එකට සම කර බෙර ඇඳින් මෙනී
පැහැපත සුද නොහල වැලි අතුළ මළු වැනී

- සොබා සිරිය ඉසුරුමත් බව, සදහම් පරිසරය, එකම කවියකින් වැනීම
''පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට''

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 03 |
| සමස්ත විස්තරයට | ලකුණු 07 |
| මුළු ලකුණු | ලකුණු 10 |

(07)
- ''තෝ හොර අලිය වගේ මෙතන කකා ඉන්නවා. කවුද අතක් පයක් නොහල්ලන එවුන්ට තැම්ම හදල දෙන්නේ''
- කුරක්කන් අඹරන අවස්ථාවේ ඒවා ඇඹරී පිටි වැටෙන ආකාරය.
- සෞඛ්‍ය පරීක්ෂකයා ගමට පැමිණි අවස්ථාව තාත්තා හා ඔහු අතර සිදු වූ සංවාද
- කුරක්කන් රොටී කරවෙන අවස්ථාව
- වැසිකිළිය තනන අවස්ථාව
- වැසිකිළි භාවිතය පිළිබඳ සෞඛ්‍ය පාඩම
- එකිනෙකාට හොරෙන් නව වැසිකිළිය භාවිත කිරීම.

මෙවැනි අවස්ථා උදාහරණ සමඟ විස්තර විය යුතු ය.

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 03 |
| සමස්ත විස්තරයට | ලකුණු 07 |
| මුළු ලකුණු | ලකුණු 10 |

Department of Education – Western Province